සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk
PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary } Office – 045 2223015
කාර්යාලය / Office } නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number } ME/E/11/08/2/2වෙළුම

ඔබේ අංකය / உமது இல / Your Number }

දිනය / திகதி / Date } 2024/03/01

---

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියළුම කොට්ඨාස අධ්‍යක්ෂවරු හා
සියළුම විදුහල්පතිවරුන් වෙත.

**<u>සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන විදුහල් හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතන වල අනධ්‍යයන කාර්ය මණ්ඩල වල වාර්ෂික ස්ථාන මාරු-2023(2024)</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2023.06.30 දිනැති ලිපියෙන් කැඳවන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් සලකා බැලීමෙන් පසු අනධ්‍යයන කාර්ය මණ්ඩල ස්ථාන මාරු මණ්ඩල තීරණ මත ඇමුණුම් 01 හි නියෝග ප්‍රකාරව වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කරනු ලැබේ.

02. එම ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු කර ඇති ඔබ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/පාසලේ සේවය කරන පාසල් කාර්ය සහායක,පාසල් මුරකරු සේවකයින් අනුප්‍රාප්තිකයින් සේවයට වාර්තා කරන තෙක් නොසිට මෙම ස්ථාන මාරු ලාභීන්ට නව සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් මුදාහැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.එසේම නියමිත දිනට සේවයෙන් නිදහස් නොකිරීමෙන් ඇති වන ගැටලු සම්බන්ධයෙන් එම ආයතන ප්‍රධානීන් වගකීමට බැඳෙන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

03. ස්ථාන මාරුවී යාමට ප්‍රථම ඔවුන්ගේ භාරයේ ඇති රජයට අයත් දේපල,ලියවිලි,මිල මුදල් හෝ වෙනයම් දෙයක් වේ නම් ඒවා නම් කරනු ලබන අයෙකුට විධිමත් පරිදි භාරදීමට කටයුතු සලස්වන ලෙස දන්වමි.

04.2023(2024) වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන සේවක මහත්ම මහත්මීන්ට තම අභියාචනා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ එලකර ඇති (ඇමුණුම් 02) ස්ථාන මාරු පරිපාටියේ 02 පරිශිෂ්ඨය ප්‍රකාරව මෙම ලිපිය නිකුත් කළ දින සිට 14 ක් තුළ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල හැකි බවද කාරුණිකව දන්වා සිටිමි.

බී.ඒ.සී.පී.බමුණුආරච්චි
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බී.ඒ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර